# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2300/25 - 2022 ඔක්තෝබර් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවනු ලබන නියමය**

2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙම නියමය මඟින්, 2022 ඔක්තෝබර් මස 07 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි 2022 අගෝස්තු 31 වැනි දිනැති අංක 2295/08 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කළ නියමය මඟින් අවසන් වරට සංශෝධනය වූ 2022 මැයි මස 31 වැනි දිනැති අංක 2282/26 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* නියමය, එහි I ඡේදය (අ) උප ඡේදය පහත උප ඡේදය ආදේශ කිරීම මඟින් සංශෝධනය කරමි.

"(අ) (i) 2018 නොවැම්බර් මස 01 වැනි දිනැති අංක 2095/20 දරන *අති විශේෂ ගැසට් නිවේදනයේ* උපලේඛනයේ I වන හා II වන තීරුවල සංයෝජිත වර්ගීකරණ සංකේත හා විස්තරයෙහි සඳහන් කරනු ලැබ ඇති භාණ්ඩ ආනයනය මත එම උපලේඛනයේ III වන තීරුවේ ඊට අනුරූපීව දක්වා ඇති අනුප්‍රමාණයට ;

(ii) සංයෝජිත වර්ගීකරණ කේත අංක 9619.00.10 යටතේ සනීපාරක්ෂක තුවා (පෑඩ්) සහ ටැම්පෝන් ආනයනය කිරීම සහ/හෝ සැපයීම මත ශූන්‍ය අනුප්‍රමාණයට; සහ"

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 06 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 10 - 0163


1A - PG 6010 — 256 (2022/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.